# වයස්ගත ජනගහනය හා ඒ ආශ්‍රිත ගැටලු

ධනුෂා ලක්මාලි[1]

**සංක්ෂේපය**

විශ්වයේ සෑම රටක්ම පාහේ ජන සංඛ්‍යාව වර්ධනය වීම ආශ්‍රිතව උද්ගතව ඇති විවිධාකාර ගැටලු වලට මුහුණ දී සිටි. මෙසේ ජනගහනය වර්ධනය වීමත් සමග වර්තමාන ලොක් යේ සියලුම රටවල් දැඩිව මුහුණ පා සිටින සමාජ ප්‍රශ්නයක් ලෙසට ජනගහනය වයස්ගත වීම පෙන්වා දිය හැකිය. ශ්‍රී ලංකාව පිළිබඳ අවධානය යොමු කිරීමේදි විසිවන සියවසේ දෙවන භාගයෙන් වැඩි කාලයක් තරුණ ජනගහනය වැඩි වීමෙන් පැණ නැගුණු ගැටලු වූ ඉහළ ළමා යැපුම් අනුපාතය හා සීඝ්‍රයෙන් වර්ධනය වූ ශ්‍රම බලකායක් යන ප්‍රශ්න තුළ මුහුණ දී සිටියේ ය. නමුත් විසි එක්වන සියවස වනවිට මෙරට ජනගහනය වසස්ගත වීම පිළිබඳ ගැටලු වලට මුහුණ දී සිටි. මෙසේ ජනගහනය වයස්ගත වීම නිසා ප්‍රධාන වශයෙන් රටක ආර්ථික, සමාජීය හා සංස්කෘතික ක්ෂේත්‍රයන් කෙරෙහි සිදුවන විවිධාකාර බලපෑම් කවරේද යන්න හදුනාගැනීම මෙම අධ්‍යනයෙහි අරමුණ වේ. ඒ සදහා ද්විතික දත්ත යොදා ගනිමින් එනම් දේශීය මෙන්ම විදේශීය දත්ත මුලාශ්‍ර පදනම් කරගනිමින් වයස්ගත ජනගහනය වර්ධනය කෙරෙහි බලපා ඇති හේතු සාධක විමසා බැලමී ත් වයස්ගත ජනගහනය නිසා වර්තමානය වනවිට ඒ තුළින් රටක ආර්ථිකය තුළ සමස්ථ යැපුම් අනුපාතය හා මරණ අනුපාතය ඉහළ යාමනිසා ජනිතවන ආර්ථිකමය ගැටලු උත්පාදනය වන තත්ත්වයක් නිර්මාණය වී ඇති ආකාරය හදුනාගත හැකිය. මෙම ගැටලු වඩාත් ඵලදායි අයුරින් විසදා ගැනීම සදහා කායික හා මානසික වශයෙන් ශක්තිමත් ඔවුන් තවදුරටත් ආර්ථික වෘද්ධි ක්‍රියාවලියට දායක කැරගැනීම හා සෞඛ්‍ය පහසුකම් පුලුල් කිරීම යනාදි විසදුම් ක්‍රියාත්මක කළ යුතයු .

**මුඛ්‍ය පදඃ** *වසස්ගත වීම, ජනගහනය වර්ධනය, යැපුම් අනුපාතය, මරණ අනුපාතය*

## හැඳින්වීම

වියපත් භාවය යන්න මිනිස් ජීවිතයක් පිළිබදව සලකා බැලීමේදි ඒ තුළ විවිධාකාර වූ දැනුමෙන්, අත්දැකීමෙන්, පරිණතබවින් පිරි ජීවිතයක් උපරිම කාලය කරා ළගා වූ අවස්ථාවක් ලෙස හැදින්විය හැකිය. පොදුවේ තමාට වඩා වයසින් වැඩි අයෙකු ලෙස සලකන නමුත් වැඩිහටි යෙකු ලෙස අර්ථ දක්වනු ලබන්නේ වයස අවුරුදු 60 ඉක්ම වූ අයෙකු ලෙස හැදින්විය හැකිය. වයෝවෘද්ධියට පත් වූවකු හදුනා ගත හැකි නිශ්චිත වයස් සීමාවක් නොමැත. ශ්‍රී ලාංකික සමාජයේ රාජ්‍ය සේවයේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 55කි. එහෙත් අවශ්‍ය නම් වයස අවුරුදු 60 දක්වා වුවද රාජ්‍ය සේවයේ නියලී සිටිය හැකිය. මෙයින් පැහැදිලි වන්නේ විශ්‍රාම ගැනීම වයස සලකා

[1] සමාජ සංඛ්‍යානය (විශේෂවේදී) තෙවන වසර,
danushalakmali1027@gmail.com

බලා ගන්නා තීරණයක් බවයි. ඇතමුන් වයස අවුරුදු 75-80 දක්වා සක්‍රිය වන අතර තවත් කොටසක් වයස අවුරුදු 40-50 වන විට හෝ බෝහෝ විට ඊටත් වඩා අඩු වයසේදි ශාරීරික හ මානසික ශක්තියෙන් පිරිහි දුබල තත්ත්වයට පත් වී සිටී. මෙයින් පැහැදිලි වන්නේ වයෝවෘද්ධිය තීරණය කිරීමට නිශ්චිත මිණුම් දඬුවක් නොමැති බවයි.


වයස්ගත වීම යන්න  පිළිබඳ විවිධ නිර්වචන පවතී. වර්තමානයේ ලොව බොහො රටවල් දෙස අවධානය කිරීමේදි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ එම රටවල මුලු ජනගහනයෙන් වියපත් ජනගහන ප්‍රතිශතය සැලකිය යුතු අන්දමින් වර්ධනය වී ඇති බවයි. මෙය ජීවිත අපේක්ෂාව මට්ටමේ වර්ෂනයෙහි ප්‍රතිඵ ලයක් සහ සාඵල්‍යතාවය අඩු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස අර්ථ දැක්විය හැකිය. පුද්ගලයා වයස්ගත වීම යන සංකල්පය හඳුනා ගැනීමේදි ඒ සඳහා ප්‍රජා විද්‍යාඥයෝ සහ ආර්ථික විද්‍යාඥයෝ සාමාන්‍යයෙන් මහලු වයස ලෙස අවුරුදු 65 සලකති. වයස්ගත වීම යන්න පිළිබඳ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල කරුණු දක්වන්නේ " ජනගහනයේ වයස්ගත පුද්ගලයන්ගේ සාපේක්ෂ වැඩිවීම ජනගහනය වයස්ගත වීම ලෙස බෝහෝ දුරට හඳුන්වයි." බටහිර රටවල පොදු වශයෙන් වියපත් වුවන් ලෙස වයස අවුරුදු 65 සහ ඊට වැඩි පිරිස වන අතර සංවර්ධනය වෙමින් පවතින රටවල වයස අවුරුදු 60 සහ ඊට වැඩි පිරිස වයස්ගත ජනගහනය ලෙස සැලකේ.

**ලෝක ජනගහනය තුළ වයස්ගත ජනගහනය වර්ධනය වීම ආශ්‍රිත ප්‍රවණතා.**

වර්ධනය වන ලෝක ජනගහනය තුළ වයස්ගත ජනගහනය හඳුනා ගැනීමේදි එය කොටස් දෙකකට බෙදිය හැකිය. එනම් වයස අවරුදු 60-74 අතර පුද්ගලයින් සහ වයස අවුරුදු 75 හෝ ඊට වැඩි වයස්ගත පුද්ගලයින් වශයෙනි. 1971 දි මුලු ජනගහනයෙන් වයෝවෘද්ධ ජනගහනයෙන් ප්‍රතිශ තය 19ක් වුවත් එම ජනසංඛ්‍යාව 2031 දී සියයට 29 දක්වා වැඩිවන වන රටාව අනුව බලන විට සාමාන්‍යයෙන් මිනිසකුගේ ජීවත් වන කාල සීමාව වසර 20කින් පමණ වැඩි වී ඇත. ලෝකයේ වයස්ගත ජනගහනයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන අතර අනාගතයේ වයස්ගත ජනගහනය සීඝ්‍රයෙන් ඉහළ යනු ඇත.

එක්සත් ජාතීන් පෙන්වා දෙන ආකාරයට 1970 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ වයස අවුරුදු 65 හා ඊට වැඩි ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය පහත පරිදි පෙන්වා දිය හැකිය. වයස්ගත ලෝක ජන සංඛ්‍යාවට සමානුපාතිකව ආසියාතික ජන සංඛ්‍යාව 1970 වර්ෂයේදි 42% හා 1980 වර්ෂයේදි 43% දක්වාද 1990 වර්ෂයේදි 46% දක්වාද සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය තවදුරටත් වසර 2000 වනවිට 48% දක්වා වර්ධනය විය හැකි බවට අනාවැකි පළ කර ඇත.

ප්‍රස්ථාරය 1: වර්ෂ 2050 වනවිට වයස්ගත ජනගහනයේ ව්‍යාප්තිය




මුලාශ්‍රයඃ United Nations,2002, World population prospects, the revision 2002

වගුව 1: ආසියාවේ හා දකුණු ආසියාවේ ජන සංඛ්‍යාව එම සංඛ්‍යාවෙන් ලෝක සහ ආසියානු ජන සංඛ්‍යාවේ සමානුපාතයක් ලෙස.

| රට | 1970 | 1980 | 1990 | 2000 |
|---|---|---|---|---|
| ආසියාව(මිලියන වලින්) | 84 | 110 | 143 | 191 |
| අවුරුදු 65 සහ ඊට වැඩි ලෝක ජන සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස | 42.0 | 42.6 | 45.8 | 48.2 |
| දකුණු ආසියාව(මිලියන වලින්) | 33 | 43 | 58 | 82 |
| අවුරුදු 65 සහ ඊටවැඩි ආසියාතික ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 39.3 | 39.1 | 40.6 | 42.6 |
| අවුරුදු 65 සහ ඊට වැඩි ලෝක ජන සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස | 16.5 | 16.7 | 18.6 | 20.7 |

මුලාශ්‍රයඃ ආර්ථික විමසුම, 1996 (වෙලුම 25).

මේ ආකාරයට ලොව පුරා විවිධ රටවල වයස්ගත ජනගහනය වැඩිවීම සමාජ ප්‍රශනයක් බවට පත්වෙමින් තිබේ. ආසියානු හා දකුණු ආසයි ානු රටවල ඇතැම් ස්ථානයන්හි හැර ලොව බොහෝ රටවල මිනිසාගේ ආයු කාලය ඉහළ ගොස් ඇත. ජපානයේ හා ස්කැන්ඩිනේවියානු රටවල එය වයර 80 කි . ඉන්දියාවේ සාමාන්‍ය ආයුකාලය වසර 62කි. වැඩිහිටි ජනගහනය පිළිබඳව ලොව සෑම රටක්ම පාහේ විශාල උනන්දුවක් දක්වා ඇත. මෑත දී ලෝක බැංකුව විසින් කරන ලද අධ්‍යයනයකට අනුව ලෝක ජනගහනයෙන් වයස අවුරුදු 80ට වැඩි ස්ත්‍රීන් 61%ක් සංවර්ධිත රටවල් නියෝජනය කරයි. නමුත් 2025 වනවිට ජනගහනයෙන් වැඩිහිටි වයස්ගත වුවන් සංවර්ධනය වෙමින් පවතින රටවලද ජීවත් වනු ඇතැයි වාර්ථා වේ. වර්තමානයේ ආසියාවේ වයස්ගත ස්ත්‍රීන් සංඛ්‍යාව 44% වන අතර 6% අප්‍රිකාවේද ලතින් ඇමරිකාවේ 7%ක්ද ජීවත් වන බව සංඛ්‍යා ලේඛන වලින් හෙළි වේ.

**ආසියාවේ සහ දකුණු ආසියාවේ වයස්ගත වු පිරිස්.**

ජන සංඛ්‍යාව වයස් ගත වීම වර්තමානයේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල අතර ද දක්නට ලැබෙන සංසිද්ධියකි. දකුණු ආසියාණු කලාපය ආශ්‍රිතව බලන විට ශ්‍රී ලංකාවේ වියපත් වීමේ ක්‍රියාවලිය වර්මානයේ හා අනාගතයේදි සුවිශේෂි වනු ඇත. වසර 2000 දී හා වසර 2030 දී දකුණු ආසියාණු කලාපයේ අනෙකුත් රටවල් සසඳන විට ශ්‍රී ලංකාව වයස අවුරුදු 60-70 වැඩි සමානුපාතය බෙහෙවින් ඉහළ ය. මෙහිදි දකුණු ආසයි ානු කලාපයේ අනිකුත් රටවල් හා බලන විට වයස අවුරුදු 60ට වඩා වැඩි වයස්ගත පුද්ගල ප්‍රතිශතය වසර 2000 දී බංගලාදේශය 4.9% ප්‍රතිශතයක් පෙන්නුම් කළ අතර එම සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ 9.8% විය. අවුරුදු 60ට වැඩි වයස්ගත පරිස 2030 වනවිට ශ්‍රී ලංකාවේ 21.5% ප්‍රතිශතයක් ගන්නා බවට ප්‍රක්ෂේපනය කර ඇත.

වගුව 2: රටවල් කිහිපයක වයස්ගත ජනගහන ව්‍යුහය.


| | 2015 | 2050 | 2100 |
|---|---|---|---|
| | **0-14 15-59 60+ 80+** | **0-14 15-59 60+ 80+** | **0-14 15-59 60+ 80+** |
| ඇෆ්ගනිස්ථානය | 44 52 4.0 0.2 | 24.9 66.1 9.0 0.6 | 16.0 57.2 26.8 4.2 |
| බංගලාදේශය | 29.4 63.6 7.0 0.9 | 17.2 61.3 21.5 3.6 | 14.2 48.7 37.1 13 .5 |
| භූතානය | 26.9 65.8 7.4 1.0 | 15.8 59.6 24.5 3.8 | 14.1 48.5 37.4 14.1 |
| ඉන්දියාව | 28.8 62.3 8.9 0.9 | 19.1 61.5 19.4 2.8 | 14.7 51.2 34.1 10.3 |
| නේපාලය | 32.7 58.7 8.6 0.7 | 17.4 64 .6 17.9 2.4 | 13.1 47.1 39.8 13.4 |

| | | | |
|---|---|---|---|
| පකිස්ථානය | 35.0 58.4 6.6 0.6 | 25.0 62.1 12.9 1.3 | 16.8 56.9 26.2 5.3 |
| ශ්‍රී ලංකාව | 24.6 61.5 13.9 1.5 | 17.3 54.1 28.6 6.6 | 13.5 46.6 40.0 15.2 |

මූලාශ්‍රය: United Nations"World population prospects" the 2015 revition

ඉහත වගුවට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත් වන ආකාරයේ කැපී පෙනෙන වෙනස මධ්‍යස්ථ වයස අනුව සලකා බැලුවිට පෙනී යන්නේ වසර 2000දී 6-9ක්වූ මධ්‍යස්ථ වයස වසර 2030 වනවිට 39 දක්වා ඉහළ යනු ඇතැයි ගණන් බලා තිබේ. අනිකුත් දකුණු මධ්‍යම ආසියානු රටවල් හා සැසදීමේ දි ශ්‍රී ලංකාවේ වයස්ගත වීමේ ක්‍රියාවලියේ සුවිශේෂී වෙනසට හේතු වී ඇත්තේ දැනටමත සම්පූර්ණ තත්ත්වයට ළගා වෙමින් පවතින ප්‍රබල හා වේගවත් ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය හේතු සාදක වී ඇත.  ආසියානු රටවල ජනගහනය ගත්විට එහි ජනගහනයෙන් වැඩි කොටසක් සිටිනුයේ වයස අවුරුදු 60 පසුකර යන අයවීම මෙම රටවල දැකිය හැකි සුවිශේෂිතාවයකි. විශේෂයෙන්ම මෙම රටවල වැඩිහිටියන්ට ලැබෙන රැකවරණයේ ස්වාභාවය හා ඔවුන්ගේ දෙවන පරම්පරාව සමග ඇති ඥාති සම්බන්ධතාවයේ ස්වභාවය බොහෝවිට  තීරණය වන්නේ වයස්ගත වුවන් ඔවුන්ගේ ඥාතීන් සමග එක්ව ජීවත් වනවාද නැද්ද යන්න මතය. 1986 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ ඇස්තමේන්තුව අනුව ශ්‍රී ලංකාව දකුණු ආසියාතික රටවල් අතරින් ඉදිරි වසර කිහපි ය තුළ වේගවත්ව වයස්ගත වීමේ ක්‍රියාවලිය සිදුවිය හැකි රටවලින් එකක් ලෙස හැදින්විය හැකිය. මෙම ඇස්තමේන්තුව අනුව ශ්‍රී ලංකාවේ 1980 වර්ෂයේදී 4.3% පමණ වූ වයස්ගත වුවන්ගේ සංඛ්‍යාව 2025 දි 10% වඩා වැඩි ප්‍රමාණයකට වේගයෙන් ඉහළ යනු ඇත. එවැනි තත්ත්වයක් තුළ සෑම ගෘහයකම වයස්ගත පුද්ගලයින් සිටිනු ඇත. දකුණු ආසියාවේ රටවල් අතරින් ශ්‍රී ලංකාව ද ඉතාමත් වේගයෙන් වයස්ගත වන ජනගහනයක් සිටින රටවලින් එකක් ලෙස හැදින්විය හැකිය.

ප්‍රස්ථාරය 2: 1980 වර්ෂය සිට 2025 දක්වා රටවල් කිහිපයක ජනගහන ප්‍රතිශතය වෙනස් වන ආකාරය





මූලාශ්‍රය: United Nations, World population prospects, the 2015 revision.

ජනගහනයේ වයස් ව්‍යුහය ගත්විට පුළුල් පාදයක් සහිත පිරමීඩයකින් සිලින්ඩරාකාර හැඩයට පරිවර්තනය වීමක් පෙනේ. මෙයට හේතුව බාල වයස් පුද්ගලයන්ගේ සංඛ්‍යාවට සාපේක්ෂව වැඩි මහල් පුද්ගලයන්ගේ සංඛ්‍යාව වැඩිවන නිසාය. ජනගහනය වයස්ගත වීම යනුවෙන් හඳුන්වන මෙම ක්‍රියාවලිය විවිධ වයස් ඛාණ්ඩ වල පුද්ගලයින් ප්‍රමාණාත්මකව වෙනස් වීමකි. එය මිනිසුන්ගේ ජීවිත කෙරෙහි ඍජු ගුණාත්මක බලපෑමක් ඇතිකරනු ලැබේ. ජනගහනයේ වයස් ව්‍යුහය වේගයෙන් වෙනස් වන අයුරු පහත පිරමීඩ තුළින් අවබෝධ කරගත හැකිය.

1991 වර්ෂය 2031 වර්ෂය

පුරුෂ ස්ත්‍රී ස්ත්‍රී පුරුෂ



මුලාශ්‍රයඃ ආර්ථික විමසුම, 1996 (වෙලුම 25).

මේ ආකාරයට 1991 වර්ෂයේ සිට 2031 වර්ෂය දක්වා බාලවයස් පුද්ගලයින් සංඛ්‍යාව අභිමවා වයස්ගත ජනහනය වැඩිවීම නිසා 2031 වර්ෂය වන විට ක්‍රම ක්‍රමයෙන් රටේ ආර්ථිකය තුළ නොයෙකුත් ආර්ථික විචල්‍යන්ගේ වෙනස්කම් සිදුවන බැව් හඳුනාගත හැකිය. එනම් සමස්ථ නිෂ්පාදනයේ පරිමාව හා පාරිභෝජනය පුළුල් වීමත් එක් එක් කුටුම්භ තුළ ආයෝජන හා පෞද්ගලික ඉතිරිකිරීම් යනාදියෙහි පහළ අනුපාතයක් දැකිය හැකිය. වයස්ගත ජනසංඛ්‍යාව වැඩිවීම නිසා ඉල්ලුමට සරිලන සැපයුම සමතුලිත නොවුවිට රටෙහි ග්‍රාමීය නාගරික සීමාවන් තුළ අර්බුද නිර්මාණය වන තත්ත්වයක් බිහි වේ. එනම් ජනයා තම දෛනික අවශ්‍යතා ඉටුකරගැනීමට නොහැකිව නගරය තුළට සංක්‍රමණය වන තත්ත්වයක් වර්මානය වන විට දැකිය හැකි වේ.

### ජනගහනය වයස්ගත වීම තුළින් මතුවන ගැටලු

ජනගහනය වයස්ගත වීම සංවර්ධනය වෙමින් පවතින් රටවලට එක් ආකාරයකටත් සංවර්ධිත රටවලට තවත් ආකාරයකටත් බලපෑම් කරනු ලැබේ. මෙසේ ජනගහනය වයස්ගත වීමේ ප්‍රතිපලයක් වශයෙන් මතු වී ඇති වැදගත් ගැටලුවක් වන්නේ වයස්ගත පුද්ගලයින් උදෙසා ආර්ථික හා සාමාජීය ආධාර කොතෙක් දුරට සාර්ථකව සැපයිය හැකිද යන්නයි. එනම් කිසියම් පිරිසක් සිදුකරන නිෂ්පාදනය

ඊට විශාල සංඛ්‍යාවක් අතර බෙදී යයි. ඒකජන නිමවුම හා ඒකජන ඉතිරිකිරීම් අඩු වෙයි. නිෂ්පාදනයට එකතු වන පිරිසට වඩා පාරිභෝජනයට එකතුවන පිරිස වැඩිවන හෙයින් සංවර්ධන වියදම වැඩිකර ගැනීම අපහසුය. වර්තන වියදම් නොකඩවා ඉහළ නගිමින් පවතී. ජන සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩිවීම නිසා සුභ සාධන වියදම ඉහළ යයි. රජයෙන් බලාපොරොත්තුවන සුභසාධන කටයුතු වැඩිවීමත් සමග ආර්ථික පීඩනය වැඩිවන තත්වයක් දැකිය හැකි වේ. වයස්ගත ජන සංඛ්‍යාවේ වැඩිවීම නිෂ්පාදනයට වඩා පාරිභෝජනය පුළුල් වීමට හේතුවන බැවින් භාණ්ඩ හා නොයෙකුත් පහසුකම් සේවා සඳහා ඇති ඉල්ලුම සීඝ්‍රයෙන් ඉමළ ගොස් ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ උද්ධමනය සම්බන්ධයෙන් වයස්ගත ජන සංඛ්‍යාව වැදගත් සාධකයකි. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ වයස්ගත වීම රාජ්‍ය මට්ටමින් විසඳිය යුතු ගැටලුවක් බවට වර්තමානයේ පත්විය යුතුය. වයස්ගත වීම තුළින් මතුවන ගැටළු හා ප්‍රශ්න පිළිබඳව රජයේ පූර්ණ අවධානයක් අති බව පෙනීයන නමුත් එම අවධානය නිශ්චිත සැලසුමක් අනුව ක්‍රියාවේ යොදවන්නේ දැයි සොයා බැලීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම වයස්ගත වුවන් නඩත්තු කිරීමට අපොහොසත් වීමද මෙහිදි පැන නගින ගැටලුවක් වී ඇත. නාගරික ප්‍රදේශ වලට වඩා ග්‍රාමීය ප්‍රදේශවල වයස්ගත වුවන් සඳහා සාම්ප්‍රධායික ආධාර කිරීම තවමත්  බොහෝ දුරට දක්නට ලැබේ. ජනගහනය වයස්ගත වීම සෞඛ්‍ය අංශය කෙරෙහි විශාල බලපෑමක් සිදුකර ඇත. න්‍යායාත්මකව බලන විට වයස් සීමාවක් නොමැතිව අවශ්‍ය සියලු දෙනාටම ප්‍රතිකාර සපයනු ලැබේ. වර්තමානයේ ජීවිත අපේක්ෂාව ඉහළ යෑමේ ප්‍රතිපලයක් ලෙස ජීවත් නව කාලය දීර්ඝ වන අතර එම තත්ත්වය රෝග වැඩි වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි.

වයස්ගත ජනගහනය රටක සේවා වියුක්තිය නියෝජනය කරයි. වයස්ගත වුවන් ඉතා සුළු ප්‍රමාණයක් ආර්ථිකමය හා සමාජයමය වශයෙන් ඵලදායි කටයුතු වල යෙදෙන නමුත ් එලෙෂ නිරත වි සිටින අනුපාතය පහළ යමින් පවති. ඒ නිසා රැකියා නියුක්ත වයස්ගත ප්‍රමාණය වසරින් වසර වෙනස් වේ. එහෙත් වයස අවුරුදු 50 හෝ ඊට වැඩි වයස්වල සිටින විශාල සංඛ්‍යාවකට විශ්‍රාම යෑම සහ රැකියාවෙන් ඉවත් විමට සිදු වුවද මෙම තත්ත්වය ප්‍රශ්නයක් නොවිමට නම් විශ්‍රාම යන විශාල පිරිසක් ඔවුන්ගේ දක්ෂතාවය හා ක්‍රියාකාරිත්වය උපරිම ලෙස වර්ධනය කරගෙන ඔවුන් රටේ සංවර්ධනය සඳහා දායක කරගැනීම සිදුකළ යුතයු . එහෙත් වයස්ගත බොහෝ පිරිසක් තුළ අඩු උනන්දුවක් සහ කලින් විශාමු යාම නිසා ශ්‍රම වෙළඳපොළෙන් ඉවත් විමක් සිදු වේ. මෙයද ජනගහනය වයස්ගත විම හා සම්බන්ධ ප්‍රධාන ගැටලුවකි.

මීට අමතරව ජීවන රටාවේ සහ තරුණ වගකීම් වෙනස්වීම දරුවන්ග් නව ක්‍රියාකාරි රටාව හා ස්ත්‍රීන් නිවසින් පිට රැකියාවන් වල නියුක්ත වීම ආදිය තුළින් වයස්ගත වුවන් රැකබලා ගැනීම සඳහා වන කාලය සීමා වී ඇත. නාගරීකරණයේ ප්‍රතිඵල ලෙස බිහි වු තට්ටු නිවාස වල ඉඩකඩ මදිවීම, වර්තමානයේ පවුලක සිටින දරුවන් සංඛ්‍යාව අඩුවීම, බොහෝවිට ඔවුන්ද රැකියාවන් සඳහා දෙමාපියන්ගෙන් වෙන්ව දුර බැහැර ප්‍රදේශවලින් පදිංචි වීම, දරුවන්ද විවිධ ආර්ථික ප්‍රශ්න වලින් පීඩා විදීම

හේතුකොට ගෙන ඔවුන් තුළින් ඇතිවන මානසික කළකිරීම් හේතුවෙන්ද දරුවන් හා දෙමාපිය පාර්ෂව තුළින් විවිධ ගැටලු ජනිත විය හැකිය.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාව මුහුණ දීමට ඇති ප්‍රධාන සමාජ ආර්ථික සහ මානුෂික අභියොග් වලින් එකක් වනුයේ ජනගහනය වයස්ගත වීමයි. එහි වයස්ගත වන ප්‍රමාණය දකුණු ආසියාවේ වෙනත් ඕනෑම රටක තත්ත්වයට වඩා දෙගුණයකි. වයස අවුරුදු 60 හෝ ඊට වැඩි අය වසර 1970-2000 වසර අතර කාලය තුළ ජනගහනය 6.3%-9.8% දක්වා වැඩි විය. ඊට අමතරව වර්ෂ 2000-2030 කාලය තුළදී වඩා වැඩිවිමක් බලාපොරොත්තු විය හැකිය. මෙය වසස අවුරුදු 60 හෝ ඊට වැඩි පුද්ගලයින්ගේ ගණන වැඩි විමක් පමණක් නොව වැඩිහිටි ජනගහනයම වයස්ගත විමයි. දූ දරු සම්බන්ධතාවයන් දුරස්විම, වයස්ගත පුද්ගලයින්ට සහාය හා රැකවරණය සැපයීමට පවුලට ඇති නොහැකියාව, පිරිහුණු පවුල් ශක්තිය, වැඩි කාන්තාවන් පිරිසක් ශ්‍රම බලකායට එකතු වීම, විස්තීර්ණ පවුල් ක්‍රමයේ පිරිහීම, පවුලේ සාමාජිකයන් චලනය වීම යන සාධක වැඩිහිටියන් සඳහා බලපාන බවට නිගමන වශයෙන් හඳුනා ගත හැකිය. වයස අවුරුදු 60-70 සීමාව තුළ පසු වන්නන් කායික හා මානසික වශයෙන් බෝහෝදුරට ශක්තිමත්ය. ඔවුන්ව තව දුරටත් ආර්ථික වෘද්ධි ක්‍රියාවලියට දායක කරගත යුතයු . වැඩිහිටියන් සතු අමිල අත්දැකීම් දැනුම් කුසලතාවයන් ඵළදායි ලෙස යොදා ගනිමින් ඔවුන්ගේ ජීවිත වඩා සුවදායි මට්ටමකින් පවත්වාගෙන යාමට ක්‍රියාකළ යුතුය.

විශේෂයෙන්ම වැඩිහිටියන්ව තරුණ පරපුර නොයෙකුත් අංශ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් වලට සම්බන්ධ කර ගැනීමේ ක්‍රියාවලිය තුළින් වැඩිහිටියන් හා තරුණ පරපුර අතර සමීප සම්බන්ධතාවයක් වර්ධනය කිරීමටත් ඒ ඔස්සේ වැඩිහටි යන්ට ගරු කිරීමටත් ඔවුන්ව පෙළඹිය හැකිය. වැඩිහිටියන්ට රැකවරණය සලසා දිම පවුලේ වගකීමක් බව අවධාරණය කිරීමේදි ඔවුන්ට පෞද්ගලික ආදායම් මාර්ගයක් තිබීම වැදගත්ය. විශ්‍රාම වැටුප් සේවක අර්ථ සාධක අරමුදල් සියලු දෙනාටම හිමි නොවේ. රාජ්‍ය හා පෞද්ගලික අංශයට අමතරව අවිධිමත් අංශයේ විවිධ ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත වු සහ නිරත වන වයස්ගත වුවන් අප සමාජයේ කොතෙකුත් දක්නට ලැබේ. ඔවුන්ගේ ආර්ථික සුරක්ෂිත භාවය තහවුරු කිරීමට රජය පියවර ගත යුතුය. එමෙන්ම වයස්ගත පුද්ගලයින් වෙනුවෙන් ඇති රක්ෂණ යෝජනා ක්‍රම වැනි දීර්ඝ කාලනී ඉතිරිකිරීම් ක්‍රමවලට යොමුවන ලෙසට ඔවුන් ආදායම් උපයන කාලයේදී දිරිමත් කිරිම මෙම වයසගත පුද්ගලයින් හා සම්බන්ධ ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට ඇති තවත් ක්‍රමවේදයක් ලෙස හඳුන්වා දිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

United Nations, 2002, World population prospects, the revision 2002.

United Nations, 2015, World population prospects, the revision 2015.

අමරසේකර දයා, (1993), ශ්‍රී ලංකා සමාජය, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.

සෝමසුන්දර ඩී, (1991), සංවර්ධන ආර්ථික විද්‍යාව, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ-10.

සිරිවර්ධන එස්.එස්.ඒ.එල්, (1996), එක්සත් ජාතීන්ගේ ලෝක ජන සංඛ්‍යාව සහ රටවල් අනුව එහි වයස් පුමිතිරි සංයුතිය 1950-2000, ආර්ථික විමසුම, (වෙලුම 25) අප්‍රේල්/මැයි කලාපය.

සිරිවර්ධන එස්.එස්.ඒ.එල්, (1996), එක්සත් ජාතීන්ගේ ලෝක ජන සංඛ්‍යාව සහ රටවල් අනුව එහි වයස් පුමිතිරි සංයුතිය 1950-2000, ආර්ථික විමසුම, (වෙලුම 25) ජුනි/ ජුලි කලාපය.

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව, (1996), ජන හා සංඛ්‍ය ලේඛන දෙපාර්තමේන්තුව, සරසවි ප්‍රකාශකයෝ, කොළඹ 01 .

ගමගේ සිරි, (1985), සමාජ පිවිසුම, පේරාදෙණිය විශ්ව විද්‍යලෙයේ සමාජ විද්‍ය සංගමයේ ප්‍රකාශනයකි.